# පළමු වාර පරීක්ෂණය - 2014

## බුද්ධ ධර්මය

8 ශ්‍රේණිය

කාලය පැය 1 1/2

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. බුදු සිරිතෙන් අපේ දිවියට ගත හැකි ආදර්ශයකි
    i. සංවිධානාත්මක ජීවන රටාව
    ii. ලෝකානුකම්පාවෙන් කටයුතු කිරීම
    iii. සැහැල්ලු වූ ගති පැවතුම්
    iv. මහා කරුණාව ඇතුළු ඉහත කී සියළුම දෑය

02. හිරි ඔතප් යන්න හැඳින්වීමට සුදුසු ප්‍රකාශය වන්නේ
    i. ලෝක පාලන ධර්මය
    ii. අලස බව හා ඔතෑනි බව
    iii. දේව ධර්ම
    iv. පවට ඇති ලැජ්ජාව හා බය

03. චතුරාර්ය සත්‍ය පිළිවෙලින්
    i. දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග
    ii. මාර්ග , නිරෝධ , සමුදය , දුක්ඛ
    iii. දුක්ඛ , සමුදය , මාර්ග , නිරෝධ
    iv. සමුදය , දුක්ඛ , නිරෝග , මාර්ග

04. භව තණ්හාව යනු
    i. කම් සැප විඳීමට ඇති බලවත් ආශාවයි
    ii. සසරේ දී නැවත නැවත කම්සැප විඳීමට ලැබීමට ඇති ආශාවයි
    iii. නැවත උපතක් නැත කියා කම්සැපවිඳීමට ඇති ආශාවයි
    iv. ඉහත කිසිවක් නොවේ

05. බුදුරජාණන් වහන්සේ විසින් "සඳ කිඳුරු ජාතකය" දේශනා කරන ලද්දේ
    i. විශාඛා මහෝපාසිකාවට
    ii. යශෝධරා දේවියට
    iii. සුජාතා සිටුදේවියට
    iv. මහා ප්‍රජාපතී ගෝතමියට

06. සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ .......... යන ගාථා පාඨයෙහි ඇතුළත් සංඝ රත්නයේ ගුණ සංඛ්‍යාව
    i. 6 කි
    ii. 7 කි
    iii. 8 කි
    iv. 9 කි

07. අදත්තාදාන යනු
    i. සතුන් මැරීමයි
    ii. සොරකම් කිරීමයි
    iii. කාමය වරදවා හැසිරීමයි
    iv. බොරු කීමයි

08. දුක්ඛාර්ය සත්‍යයෙහි විස්තර කෙරෙන පරිදි ජාති යනු
    i. ඉපදීමයි
    ii. දිරාපත් වීමයි
    iii. ලෙඩවීමයි
    iv. මරණයට පත්වීමයි

09. නිත්‍ය ශීලය යනු
    i. පන්සිල්ය
    ii. අටසිල්
    iii. දසසිල්
    iv. අඩිසිල්

10. අපගේ ශරීරයට සුව පහසු ස්පර්ශය ලැබෙන විට සිතට දැනෙන ආස්වාදය නිසා යළි යළිත් ඒවා ලබාගැනීමට ඇතිවන ආශාව

i. රූප තණ්හාවයි
ii. පොට්ඨබ්බ තණ්හාවයි
iii. රස තණ්හාවයි
iv. ගන්ධ තණ්හාවයි

11. කර්මය වශයෙන් අප පිළිගත්තේ

i. අහඹු වශයෙන් සිදු කරන ක්‍රියාය
ii. තිදොරින් සිදු නොකර සිටින ක්‍රියාවන්ය
iii. සිතාමතා සිදු නොකරන ක්‍රියාවන්ය
iv. සිතාමතා සිදු කරන ක්‍රියාවන්ය

12. කෙනෙකු සිතා මතා සිදු කරනු ලබන ක්‍රියා බුදු දහමට අනුව බෙදෙන කොටස් ගණන වනුයේ

i. 4 ට
ii. 3 ට
iii. 2 ට
iv. බෙදිය නොහැක

13. චෛතසික දුක් හෙවත් මානසික පීඩා හැඳින්වෙන්නේ

i. දෝමනස්ස
ii. උපායාස
iii. පරිදේව
iv. ශෝකය

14. අප්‍රිය සම්ප්‍රයෝග දුක්ඛය වශයෙන් හැඳින්වෙන්නේ

i. ප්‍රිය පුද්ගලයන් සමග එකතු වීමයි
ii. අප්‍රිය සම්ප්‍රප්පලාප කියවීමයි
iii. අකමැති පුද්ගලයන් සහ අකමැති දේවල් සමග එකතුවීම
iv. අප්‍රිය ආහාර ගැනීම

15. තෘෂ්ණාවේ ප්‍රධාන ප්‍රභේද වලට අයත් නොවන්නේ

i. භව තණ්හා
ii. විභව තණ්හා
iii. කාම තණ්හා
iv. ගන්ධ තණ්හා

(2 X

- පහත දැක්වෙන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තිත් ඉරමත ලියන්න.

01. තමන් කැමති දේ නොලැබීම නිසා ඇතිවන දුක .......................... යනුවෙන් හැඳින්වෙයි.

02. චතුරාර්ය සත්‍ය පිළිබඳව විස්තර ඇතුලත් වන්නේ .......................... සූත්‍රයේ හා .......................... සූත්‍රයේය.

03. .......................... යනු පව් කිරීමට ඇති ලැජ්ජාව වන අතර .......................... නම් පව් කි ... ඇති බියයි.

04. පරලොව අදහාගෙන දෙන දානය පිළිගැනීමට සුදුසු වන නිසා මහා සංඝරත්නය .......................... ගුණයෙන් යුක්ත වෙයි.

05. මරණයෙන් මතු යළි භවයක් පිළිබඳව බලාපොරොත්තු නොවේ මේ ජීවිත කාලය තුළ වඩ වඩාත් පිනවීමට ඇති ආශාව .......................... නමින් හැඳින්වේ.

• පහත දැක්වෙන ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

01. දස අකුසල් ලෙස දැක්වෙන්නේ මොනවාද ?

02. දුක්ඛාර්ය සත්‍යයෙහි 'දුක්ඛ' ලෙස දැක්වෙන කරුණු පිළිවෙලින් ලියන්න.

03. යොවුන් අවධියේ දී ආශාවන් පාලනය කර ගැනීමෙන් සැලසෙන සෙත පෙන්වා දෙන්න.

04. ජීවිත අභියෝග ජය ගැනීම සඳහා බුද්ධ චරිතයෙන් ආදර්ශ ගත හැකි සිද්ධි හතරක් නම් කරන්න.

05. බුද්ධ චරිතයේ පිළිබිඹු වන සමාජ ආචාර ධර්ම පහක් නම් කරන්න.

06. සඟ ගුණ නවය පිළිවෙලින් ලියන්න.

07. ඔබේ ගමේ පන්සලේ හාමුදුරුවන් වහන්සේගෙන් ගිහියාට සිදුවන සේවා දහයක් ලියන්න.

(10 X 6)